# පාඨමාලා විස්තර සටහන

# 2024




කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය

ජාතීන්ගේ සංවර්ධනය උදෙසා සභාවට සම්පත්

# කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය

*ජාතීන්ගේ සංවර්තනය උදෙසා සභාවට සම්පත්*

# පාඨමාලා විස්තර සටහන
# 2024

ලෞකිකත්වය ක්‍රමයෙන් වර්ධනය වන ලොවෙහි ජීවිතය පිළිබඳ පරම අධිකාරීත්වය එක් එක් පුද්ගලයන් විසින් තමුන්ට ම ආරෝපනය කර ගන්නා යුගයක, ක්‍රිස්තු අනුගාමිකයන් ලෙස දේව වචනයෙන් හැඩ ගැන්වෙන යථාර්ථයක් මත සිටීම අතිශයින් ම වැදගත් ය. ශුද්ධ ලියවිල්ල පරම අධිකාරීත්වය ලෙස වැළඳ ගැනීමෙහි දී ජීවිත ගමනට පමණක් නොව, දේශගුණ විපර්යාසය, ස්ත්‍රී පුරුෂ භාවය, දුක් විඳීම, මරණය, ආර්ථිකය, රැකියාව, සම්බන්ධතා, ප්‍රේමය පිළිබඳ ඈඩි මතවාදශිලී ලෝක දෘෂ්ටීන් සම්බන්ධයෙන් අපගේ සිතුවිලි, ආවර්ජනයන් හා ප්‍රතිචාරයන් හට මඟ පෙන්වීමක් ගෙනේ.

අප විසින් සැලකිලිමත් විය යුතු ප්‍රශ්න කිහිපයකි: අපගේ ජීවිතවලින් ප්‍රකාශ වන පණිවුඩය කුමක් ද? ජීවිතයේ සියලු ම අංග කෙරෙහි පරම අධිකාරීත්වය ලෙස ශුද්ධ ලියවිල්ල බව පැහැදිලි ලෙස ප්‍රදර්ශනය වේ ද?

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයට පැමිණ මෙකී සත්‍යතාවන් ගවේශනය කරන්න; ක්‍රිස්තු කේන්ද්‍රී, ආත්මානුභාවයෙන් යුත්, දේව වචනයේ මුල් බැස ගත් යථාර්ථයක සිට ගැනීමට අවශ්‍ය දැනුම, පුහුණුව හා සූදනම මැනවින් ලැබෙනු ඇත.

**1971 අංක 32 දරන ශ්‍රී ලංකා පාර්ලිමේන්තු ආඥා පනත මගින් සංස්ථාපිත**
**ආසියාතික දේවධර්ම සංගමයේ තෘතික අධ්‍යාපන ආයතනයක් ලෙස පිළිගත් (ATA)**
**කොළඹ බයිබල් විද්‍යාලයේ එකම අංශයයි.**
**ශ්‍රී ලංකා ජාතික ධර්මදූනි සන්ධානයේ හා (NCEASL)**
**ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ සාමාජික (NCCSL)**

# සන්නිවේදන තොරතුරු

| | |
|---|---|
| **ලේඛකාධිකාරී** | registrar@cts.lk |
| **සම්බන්ධීකාරක: ශාස්ත්‍රීය වැඩසටහන්** | student.services@cts.lk |
| **ශිෂ්‍ය ගිණුම් කටයුතු** | student.accounts@cts.lk |
| **අධ්‍යයන ශිෂ්‍යත්ව** | scholarships@cts.lk |
| **පුස්තකාලය** | library@cts.lk |
| **තොරතුරු තාක්ෂණය** | it@cts.lk |
| **ප්‍රායෝගික සේවා පුහුණුව** | practicums@cts.lk |
| **උපදේශන වැඩසටහන්** | counselling@cts.lk |
| **ශාස්ත්‍රපති වැඩසටහන්** | ma@cts.lk |
| **ළමා සේවා ක්ෂේත්‍රය** | cm@cts.lk |
| **පීඨාධිපති**<br>දේවගැති රවින් කල්දේරා | ravin@cts.lk |
| **සහකාර පීඨාධිපති**<br>ජූලියන් දේවදසන් මහතා | julian@cts.lk |

**+94 11 2890809 | www.cts.lk**

# පටුන


*පිටු අංකය*

**පොදු තොරතුරු** **4**

## 1 වාරය: ජනවාරි-අප්‍රේල්

කාල සටහන **6**

උදෑසන සහ දහවල් පැවැත්වෙන පාඨමාලා **7 – 9**

සවස පැවැත්වෙන පාඨමාලා **9 – 10**

දේවධර්ම උපාධි සම්මන්ත්‍රණ **11**

## 2 වාරය: මැයි-අගෝස්තු

කාල සටහන **14**

උදෑසන සහ දහවල් පැවැත්වෙන පාඨමාලා **15 – 17**

සවස පැවැත්වෙන පාඨමාලා **17 – 18**

කෙටි කාලීන පාඨමාලා **19**

දේවධර්ම උපාධි සම්මන්ත්‍රණ **20**

## 3 වාරය: සැප්තැම්බර්-නොවැම්බර්

කාල සටහන **22**

උදෑසන සහ දහවල් පැවැත්වෙන පාඨමාලා **23 – 24**

සවස පැවැත්වෙන පාඨමාලා **25 – 26**

දේවධර්ම උපාධි සම්මන්ත්‍රණ **27**

**කථිකාචාර්යවරුන්ගේ විස්තර** **28 – 32**

**CTS පාඨමාලා විස්තර** **33**

**ළමා සේවා ක්ෂේත්‍රය** **34 – 35**

# පොදු තොරතුරු

**CTS පාඨමාලා:**

- CTS නියමානුකූල පාඨමාලාවක් සාමාන්‍යයෙන් පවත්වන්නේ සතියකට පන්තියක් බැගින් සති 13ක කාලයක් පුරාය.
- කෙටිකාලීන පාඨමාලා සම්පූර්ණ දින 4ක් පුරා පැවැත්වෙන කඩිනම් අධ්‍යයන පාඨමාලා වේ.
- බොහෝ පාඨමාලාවන්හි පන්තිය තුළ ගත කරන කාලයේ එකතුව පැය 24ක් වුවත් ඇතැම් ඒවායේ පැය 36ක මුළු එකතුවක් තිබිය හැකිය. එසේ නැතහොත් පැය 24ක පන්ති කාමර කාලයක්ද පැය 12ක ප්‍රායෝගික ක්‍රියාකාරකම් කාලයක්ද ඇත.

**පාඨමාලා දේශන පැවැත්වීම:**

- **පන්ති කාමරය තුළ:** පාඨමාලාව CTS කොහුවල පරිශ්‍රයේදී ඉගැන්වේ.
- **අන්තර්ජාලය හරහා:** පාඨමාලාව Zoom හරහා ඉගැන්වෙන අතර අදාළ සටහන් Moodle තුළින් ලබා ගත හැකිය. ඔබට වේගවත් අන්තර්ජාල සම්බන්ධතාවක් හා ඩිජිටල් උපාංගයක් අවශ්‍ය වනු ඇත.
- **මිශ්‍ර ශික්ෂණ මධ්‍ය:** පාඨමාලාව පන්ති කාමරය තුළ හා අන්තර්ජාලය හරහා යන දෙක මිශ්‍රව ඉගැන්වේ. ඇතැම් සතිවල ඔබගේ පන්තිය CTS කොහුවල පරිශ්‍රයේදී පැවැත්වෙන අතර අනෙක් සතිවල අන්තර්ජාලය හරහා ඉගැන්වෙනු ඇත. සැලැස්ම පිළිබඳව ඔබගේ කථිකාචාර්යවරයා පාඨමාලාව ආරම්භයේදී ඔබට දැනුම් දෙනු ඇත.

**CTS පාඨමාලා ගාස්තු:**

පාඨමාලාවක් හඳුන්වාදීමේ ගාස්තුව රු. 5000/- කි.

** කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ පාඨමාලා සහනදායි මිලකට සිසුන්ට සැපයීමට හැකිව ඇත්තේ එය සේවයේ මිතුරන්ගේ නොමසුරු මූල්‍ය පරිත්‍යාගශීලීත්වය නිසා බැව් අපි කෘතඥතා පූර්වකව සිහිපත් කරමු. මෙම සුවිශේෂී සැපයුමේ යහපත් ගබඩාකරුවන් වීම සිසුන්ගෙන් අපේක්ෂා කෙරේ.*

**පාඨමාලා සඳහා CTSහි ලියාපදිංචි වන ආකාරය:**

සම්පූර්ණ කරන ලද ලියාපදිංචි වීමේ අයදුම් පත https://www.cts.lk/online-registration/ හෝ ශිෂ්‍ය ගිණුම් අංශයට භාර දෙන්න. ගෙවීම් අන්තර්ජාලය හරහා https://www.cts.lk/payment/, බැංකු හුවමාරු තුළින්, ක්‍රෙඩිට් කාඩ් හෝ මුදලින් කළ හැකිය.
***සැලකිය යුතුයි:*** *පන්තියක ඔබගේ ස්ථානය වෙන්කරනු ලබන්නේ ඔබ පාඨමාලාව සඳහා සම්පූර්ණ ගෙවීම කළ පසුවය.*

**වැදගත්:** පළමු වරට පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වන්නන්
ඔබගේ සභාපාලකතුමාගෙන් නිර්දේශ ලිපියක් රැගෙන ආ යුතුය.

**ලියාපදිංචි විය හැකි දින හා වේලාවන්:**

යම් වාරයක පාඨමාලා සඳහා ලියාපදිංචි විය හැක්කේ එම වාරය ආරම්භ වන දින දක්වා පමණි.

***පළමු වාරය: 2024 ජනවාරි 8***
***දෙවන වාරය: 2024 මැයි 6***
***තෙවන වාරය: 2024 සැප්තැම්බර් 2***

කොහුවල CTS පරිශ්‍රයේදී ලියාපදිංචි වීමේ අයදුම් පත්‍රය බාර දීම හා ගෙවීම් කරන්නේ නම් ඔබ එය කළ යුත්තේ වැඩකරන දිනයන්හි (සඳුදා සිට සිකුරාදා) උදේ 9:00 සිට සවස 4:30 දක්වා ය.

# 1 වාරය

# 2024 ජනවාරි 8 - අප්‍රේල් 6

○ පන්ති කාමරය තුළ | □ අන්තර්ජාලය හරහා | ★ මිශ්‍ර ශික්ෂණ මාධ්‍ය

# කාල සටහන - 1 වන වාරය

| වේලාව | සඳුදා | අඟහරුවාදා | බදාදා | බ්‍රහස්පතින්දා | සිකුරාදා |
|---|---|---|---|---|---|
| උදෑසන | ○ **යෙසායා**<br>පෙ.ව.9:00-පෙ.ව.11:15<br>මහින්ද මුණසිංහ | ○ **බයිබලීය අර්ථ විග්‍රහය**<br>පෙ.ව.9:00-ප.ව.12:00<br>රවින් කල්දේරා<br><br>○ **පිබිදීමේ ප්‍රගමනයේ ඉතිහාසය**<br>පෙ.ව.9:00-පෙ.ව.11:00<br>ඇන්තනි සයිමන් | ○ **බයිබලීය සාමසාධනය**<br>පෙ.ව.9:00-ප.ව.12:30<br>ඊන්ස්ටීන් ප්‍රනාන්දු<br><br>සහභාගිකමේ කාලය<br>පෙ.ව.10:30-පෙ.ව.11:30 | ○ **නව ගිවිසුමට හැඳින්වීමක්**<br>පෙ.ව.9:00-ප.ව.12:30<br>නාමල් වීරසිංහ<br><br>දේව මෙහෙය<br>පෙ.ව.10:30-පෙ.ව.11:30 | ○ **සභා ආකෘති**<br>පෙ.ව.9:00-ප.ව.12:30<br>රවින් කල්දේරා |
| දහවල් | ○ **ආත්මික දීමනා**<br>ප.ව.3:00-ප.ව.5:00<br>විමලසේන ජයලත් | ○ **බලපෑමක් ඇති කළ දූතනගාමියෝ**<br>ප.ව.3:00-ප.ව.5:00<br>සනත් අතුකෝරාළ | □ **ළමයා, කිතුනු සභාව හා ධර්මදූත සේවය**<br>ප.ව.3:00-ප.ව.5:00<br>චමිලා සුභාෂ් රණසිංහ | ○ **දරුදැරියන් සඳහා ශ්‍රාවකත්වය**<br>ප.ව.3:00-ප.ව.5:15<br>ක්‍රිස්නි එදිරිසිංහ | ○ **කිතුනු දැක්ම තුළ සන්නිවේදනය**<br>ප.ව.3:00-ප.ව.5:30<br>මධු මිහිරි ප්‍රනාන්දු |
| සවස | ★ **ශ්‍රාවකත්වය**<br>ප.ව.6:00-ප.ව.8:00<br>සරත් ද සිල්වා | □ **දෙවියන් වහන්සේ සහ ලෝකය**<br>ප.ව.6:00-ප.ව.8:00<br>රවින් කල්දේරා | ★ **ධර්මදූත සේවයට හැඳින්වීමක්**<br>ප.ව.6:00-ප.ව.8:00<br>සනත් අතුකෝරාළ | ★ **බයිබලය අධ්‍යයන ක්‍රම**<br>ප.ව.6:00-ප.ව.8:15<br>ඊන්ස්ටීන් ප්‍රනාන්දු | □ **ඉස්ලාම් දහම ලෝක ව්‍යාපාරයක් ලෙසින්**<br>ප.ව.6:00-ප.ව.8:30<br>සනත් අතුකෝරාළ |

*නොවැළැක්විය හැකි හේතු මත ප්‍රකාශිත කාල සටහන වෙනස් විය හැකිය. ලියාපදිංචි වීමට පෙර අධ්‍යයන කාර්යාලයෙන් විමසන්න.*

# උදෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## පන්ති කාමරය තුළ

### යෙසායා

අතිශයින් සිත්ගන්නා සුලු පාඨමාලාවක් වන මෙයින් යෙසායා පොතේ ඓතිහාසික පසුබිම, කර්තෘත්වය, තීරණාත්මක සංසිද්ධීන් සහ අන්තර්ගත පණිවිඩය වර්තමානයට අදාළ වන පරිදි අධ්‍යයනය කරනු ලැබේ. දෙවියන් වහන්සේ පිළිබඳ, පැමිණෙන්නට තිබෙන මෙසායා පිළිබඳ අනාගත වාක්‍ය සහ දේව රාජ්‍යයේ පරිසමාප්තිය පිළිබඳ ඉගෙන ගත හැකිය.

**BTh|Dip වෛකල්පික**

සති 11

දිනය: සඳුද

වේලාව: පෙ.ව. 9:00-11:15

ආරම්භය: ජනවාරි 15

සම්මාන: 2

කථිකාචාර්ය: **මහින්ද මුණසිංහ**

### ආත්මික දීමනා

වත්මන් සභාවට ආත්මික දීමනා සම්බන්ධව පැහැදිලි කිරීමක් අවශ්‍ය ද? සෑම දීමනාවකටම ඇත්තේ සමාන වටිනාකම් ද? එවැනි දීමනා තවදුරටත් නොපවත්නා බවට වන තර්කයෙන් අපට පෙනී යන්නේ කුමක් ද? වත්මන් සභා ජීවිතය කෙරෙහි දීමනා පිළිබඳ බයිබලීය අවබෝධය බලපෑ හැක්කේ කෙසේ ද? ඉහත ගැටලුවලට පිළිතුරු මෙම පාඨමාලාව මගින් ගවේෂණය කෙරේ.

**BTh|Dip වෛකල්පික**

සති 12

දිනය: සඳුද

වේලාව: ප.ව. 3:00-5:00

ආරම්භය: ජනවාරි 8

සම්මාන: 2

කථිකාචාර්ය: **විමලසේන ජයලත්**

### පිබිදීමේ ප්‍රගමනයේ ඉතිහාසය

කිතුනු පිබිදීම යනු දේශීය හෝ ගෝලීය වශයෙන් ඇතිවන දෙවිඳුන් මූලික අධ්‍යාත්මික උනන්දුව ඉශ්‍රායෙල් ඉතිහාසයේ පරිහානිය හා ප්‍රතිශ්ඨාපනය පිළිබඳ බයිබලීය වෘත්තාන්තයෙන් කිතුනු පිබිදීම යන සංකල්පය මතු වෙයි. කිතුනු සසුන තුළ ඇති වූ විවිධ පිබිදීම් අධ්‍යනයෙන් ඔබගේ සේවය තුළ අලුත් වීමක් ලබන්නට පැමිණෙන්න.

**BTh|Dip වෛකල්පික**

සති 12

දිනය: අඟහරුවාද

වේලාව: පෙ.ව. 9:00-11:00

ආරම්භය: ජනවාරි 9

සම්මාන: 2

කථිකාචාර්ය: **ඇන්තනි සයිමන්**

### බලපෑමක් ඇති කළ දූතනගාමියෝ

දෙවියන් වහන්සේගෙන් මහත් දේ බලාපොරොත්තු වූ හා උන්වහන්සේ වෙනුවෙන් මහත් දේ සඳහා වෙහෙස වූ මිනිසුන්ගේ ජීවිත හා මෙහෙය දෙස බැලීමක් මෙයින් සිදුවේ. දෙවියන් වහන්සේ මේ විශ්වාසවන්ත සේවකයන් තුළින් ඔබ ප්‍රබෝධවත් කර නිර්භීතව හා විශ්වාසවන්තව ක්‍රිස්තුස් වහන්සේ අනුගමනය කිරීමට ඔබට උගන්වන සේක්වා.

**BTh|Dip වෛකල්පික**

සති 12

දිනය: අඟහරුවාද

වේලාව: ප.ව. 3:00-5:00

ආරම්භය: ජනවාරි 9

සම්මාන: 2

කථිකාචාර්ය: **සනත් අතුකෝරාළ**

1 වන වාරය | 2024 ජනවාරි 8 - අප්‍රේල් 6

# උද්‍යෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## පන්ති කාමරය තුළ

## බයිබලීය සාමසාධනය

BTh|Dip වෛකල්පික

පුද්ගලයින් අතර ගැටුම දෛනික සිද්ධියකි. එලෙසම ජාතික සහ අන්තර්ජාතික ගැටුම් කිතුනුවන්ගේ අවධානය ගනී. මේ සන්දර්භය තුළ යේසුස් ක්‍රිස්තුන් වහන්සේ අපට සාමය සඳහා මැදිහත් වන ලෙස පවසන සේක. බයිබලීය සාමය උදකිරීම කරනුයේ ගැටුමේ මූලාශ්‍ර සොයා යෑම, ගැටුම තේරුම් ගැනීම, විසඳීමට උචිත ප්‍රතිචාර දැක්වීම සහ සමාව දීම තුළිනි.

සති 12

දිනය: බදාදා

වේලාව: පෙ.ව. 9:00-ප.ව. 12:30

ආරම්භය: ජනවාරි 10

සම්මාන: 2

කථිකාචාර්ය: **ඊන්ස්ටීන් ප්‍රනාන්දු**

## නව ගිවිසුමට හැඳින්වීමක්

BTh|Dip අනිවාර්ය

නව ගිවිසුමේ පොත් තෝරා ගත් ආකාරය හා ඒවා පිළියෙල කළ ආකාරය ඉගෙන ගත හැකිය. නව ගිවිසුමේ සෑම පොතකම අඩංගු ප්‍රධාන පණිවිඩය හා එහි කර්තෘත්වය, නව ගිවිසුමේ පොත් සභාවට පළමු වතාවට ලැබුණු විට සිදුවුණු දේ පිළිබඳ ගවේෂණය කළ හැකිය. නව ගිවිසුම් සාහිත්‍ය පිළිබඳ පුළුල් අවබෝධයක් මෙම පාඨමාලාවෙන් ඔබට ලැබේ.

සති 11

දිනය: බ්‍රහස්පතින්දා

වේලාව: පෙ.ව. 9:00-ප.ව. 12:30

ආරම්භය: ජනවාරි 11

සම්මාන: 2

කථිකාචාර්ය: **නාමල් වීරසිංහ**

## දරුදැරියන් සඳහා ශ්‍රාවකත්වය

BTh|Dip වෛකල්පික

මහා පැවරීම මගින් සියලුදෙනා වෙත ධර්මදානය මෙන් ම, ශ්‍රාවකත්වය සඳහා පුහුණු කිරීමට කිතුනු අපට වගකීමක් ඇත. මා වෙතට දරුවන්ට පැමිණෙන්නට නොවළක්වන්නැයි යේසුස් වහන්සේ පැවසූ සේක. ඒ හෙයින් දරුදැරියන් යේසුස් වහන්සේ වෙතට පැමිණ උන් වහන්සේගේ භක්තිමත් ශ්‍රාවකයකු කරන්නේ කෙසේදැයි මෙම පාඨමාලාවෙන් හැදෑරීමට අවස්ථාවක් සැලසේ.

සති 11

දිනය: බ්‍රහස්පතින්දා

වේලාව: ප.ව. 3:00-5:15

ආරම්භය: ජනවාරි 11

සම්මාන: 2

කථිකාචාර්ය: **ක්‍රිස්නි එදිරිසිංහ**

## කිතුනු දැක්ම තුළ සන්නිවේදනය

BTh|Dip වෛකල්පික

මිනිසා සමග සන්නිවේදනය කරන්නාවූ දෙවියන් වහන්සේ නමස්කාර කරන ක්‍රිස්තියානින් වූ අපි සන්නිවේදන කලාවේ ඉදිරියෙන්ම සිටිය යුතු වෙමු. මිනිසා මුහුණ දෙන ප්‍රශ්න වලට මූලික හේතුවක් වනුයේ දුර්වල සන්නිවේදනයයි. ඔබගේ වෘත්තියේදී ඉවැන්ජලිස්ත සේවයේ දී පුද්ගලික ජීවිතයේ සියලු සම්බන්ධතාවයන් වලදී වැදගත් වූ සන්නිවේදනයේ කුසලතා වර්ධනය කර ගැනීමට මෙම පාඨමාලාව උපකාරී වේ.

සති 10

දිනය: සිකුරාදා

වේලාව: ප.ව. 3:00-5:30

ආරම්භය: ජනවාරි 12

සම්මාන: 2

කථිකාචාර්ය: **මධු මිහිරි ප්‍රනාන්දු**

1 වන වාරය | 2024 ජනවාරි 8 - අප්‍රේල් 6

# උදෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## අන්තර්ජාලය හරහා

### ළමයා, කිතුනු සභාව හා ධර්මදූත සේවය

ළමයෙකුට හිතැති දේවස්ථාන පසුබිමක් බයිබලයානුකූලව ගොඩනැගීමට කාලීන අවශ්‍යතාවක් ඇත. සාකල්‍ය ළමා සංවර්ධනයක් තුළින් ළමයා, කිතුනු සභාව හා ළමා ධර්මදූත සේවය පිළිබඳ පුළුල් අවබෝධයක් හා ප්‍රායෝගික අත්දැකීමක් මෙම පාඨමාලාව සපයයි.

**BTh|Dip වෛකල්පික**

සති 12

දිනය: බදාදා

වේලාව: ප.ව. 3:00-5:00

ආරම්භය: ජනවාරි 10

සම්මාන: 2

කථිකාචාර්ය:
**චමිලා සුභාෂ් රණසිංහ**

1 වන වාරය | 2024 ජනවාරි 8 - අප්‍රේල් 6

# සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## අන්තර්ජාලය හරහා

### දෙවියන් වහන්සේ සහ ලෝකය

දෙවියන් වහන්සේගේ ස්වභාවය හා ගුණාංග, මවන ලද ලෝකය, මනුෂ්‍යත්වය හා පාපයට වැටීම, යන මූලික මාතෘකා වෙත අවධානය යොමු වේ. ක්‍රමික දේවධර්මය විෂය මාලාවේ පළමු අදියරයි. බයිබලීය පදනම මුල් කරගෙන, කිතුනු චින්තන ඉතිහාසයෙන් හා සමකාලීන සංවාදයන්ද ආශ්‍රිතව අධ්‍යයනය කරනු ලැබේ.

**BTh|Dip අනිවාර්ය**

සති 12

දිනය: අඟහරුවාදා

වේලාව: ප.ව. 6:00-8:00

ආරම්භය: ජනවාරි 9

සම්මාන: 2

කථිකාචාර්ය: **රවින් කල්දේරා**

### ඉස්ලාම් දහම ලෝක ව්‍යාපාරයක් ලෙසින්

ඉස්ලාම් දහම වනාහි 21 වැනි සියවසේ ඇති එක් සුවිශේෂී ආගමික සංසිද්ධියකි. මැද පෙරදිග, ජාත්‍යන්තර සබඳතා හා යුරෝපයේ ජාතීන් සංකලනය වැනි කාරණාවලදී මෙහි බලපෑම හොඳින් දැනුනි. මෙම ලෝක ව්‍යාපාරය ගැන වඩා හොඳින් අවබෝධ කරගැනීමෙන් අන්තර් ආගමික සංවාද හා සහයෝගීතාවන්හිදී ඔබගේ දායකත්වය සපයන්නටත් මෙම පාඨමාලාව තුළින් ඔබට හැකියාව ලැබෙනු ඇත.

**BTh|Dip වෛකල්පික**

සති 10

දිනය: සිකුරාදා

වේලාව: ප.ව. 6:00-8:30

ආරම්භය: ජනවාරි 12

සම්මාන: 2

කථිකාචාර්ය: **සනත් අතුකෝරාළ**

## 1 වන වාරය | 2024 ජනවාරි 8 - අප්‍රේල් 6
# සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා
## මිශ්‍ර ශික්ෂණ මාධ්‍ය

| | |
|---|---|
| **ශ්‍රාවකත්වය**<br>*21 වන සියවසේදී ජේසුස් වහන්සේගේ මාර්ගය අනුගමනය කරනුයේ කෙසේද?*<br>පළමු ශත වර්ෂය තුළ ශ්‍රාවකත්වය යන්නෙන් අදහස් වූයේ කුමක්දැයි ඉගෙන ගෙන එම ඉගැන්වීම් අද සමාජයේ අභියෝග ජයගැනීමට අදාළ කරගැනීමට උපකාරී වේ. ව්‍යාපාරික ලෝකය තුළ, දේශපාලනය තුළ, දූත මෙහෙයන් තුළ ඇති ශ්‍රාවකත්වය පිළිබඳ විප්ලවකාරී ආකෘති හැදෑරීමක් ද සිදුවනු ඇත. | **BTh\|Dip අනිවාර්ය**<br>සති 12<br>දිනය: සඳුදා<br>වේලාව: ප.ව. 6:00-8:15<br>ආරම්භය: ජනවාරි 8<br>සම්මාන: 2<br>කථිකාචාර්ය: **සරත් ද සිල්වා** |

| | |
|---|---|
| **ධර්මදූත සේවයට හැඳින්වීමක්**<br>'දූතනය' සෑම කිතුනුවෙකුම අසා ඇති වචනයකි, එහි පැහැදිලි අවබෝධයක් නොපවතියි. මෙම පාඨමාලාව ඔබ දූතනයේ විවිධ පැතිකඩ තුළින් ගෙන යන අතර දෙවියන් වහන්සේගේ දූතනය තුළ ඔබටත්, සභාවටත් ඇති සුවිශේෂ කාර්යභාරය විවිධ මං ඔස්සේ අභියෝගාත්මක ලෙස ඉටුකිරීමට ඔබ සූදානම් කරයි. | **BTh\|Dip අනිවාර්ය**<br>සති 12<br>දිනය: බදාදා<br>වේලාව: ප.ව. 6:00-8:00<br>ආරම්භය: ජනවාරි 10<br>සම්මාන: 2<br>කථිකාචාර්ය: **සනත් අතුකෝරාළ** |

| | |
|---|---|
| **බයිබලය අධ්‍යයන ක්‍රම**<br>මෙය ස්වයං-බයිබල් අධ්‍යයනයට මහෝපකාරී පාඨමාලවකි. මෙම පාඨමාලාව තුළින් අධ්‍යාපනයට අදාළ ප්‍රශ්න ඇසීමටත් ජීවිතයට අදාළ කර ගැනීමටත් පුරුදු පුහුණු කරනු ඇත. බයිබලය අධ්‍යයනය කරන ක්‍රම හයක් සහ බයිබලය අධ්‍යයනයට ඇවැසි මෙවලම් ගැන උගනුමට මං පාදයි. | **BTh\|Dip අනිවාර්ය**<br>සති 11<br>දිනය: බ්‍රහස්පතින්දා<br>වේලාව: ප.ව. 6:00-8:15<br>ආරම්භය: ජනවාරි 11<br>සම්මාන: 2<br>කථිකාචාර්ය: **ඊන්ස්ටීන් ප්‍රනාන්දු** |

## 1 වන වාරය | 2024 ජනවාරි 8 - අප්‍රේල් 6

# දේවධර්ම උපාධි සම්මන්ත්‍රණ

## පන්ති කාමරය තුළ

මෙම සම්මන්ත්‍රණ සකසා ඇත්තේ උපාධිය හෝ ශාස්ත්‍රපති වැඩසටහන්වලට ලියාපදිංචි වූ අය සඳහාය. පංති කාමරයක වැනි සැකැස්ම දේශනයක් හා සම්මන්ත්‍රණයක් අමතර සමබරතාවය ඇත. අමතර කියවීම් හා පර්යේෂණ මත පදනම්ව සිසුන් සාකච්ඡා සඳහා පත්‍රිකා සකස් කළ යුතුය.
උපාධි පාඨමාලාවේ ලියාපදිංචිය හා සම්මාන 60 සම්පූර්ණ කර තිබීම පූර්ව අවශ්‍යතාවන්ය.

### බයිබලීය අර්ථ විග්‍රහය

බයිබලය විචාරාත්මකව බැලීමේ විවිධ ක්‍රම ගැන සහ එහි විවිධ සාහිත්‍ය වර්ගයන් ගැන හැදෑරූ ශිෂ්‍යයා මෙම වැඩමුළුව තුළින් දේවවචනයේ නිධන්ගත දේ බැලීමටත්, විද්වතකු ලෙස බයිබලය හදුරා අර්ථ විග්‍රහ කිරීමටත් ඉගෙනීම ලබනු ඇත.

**BTh අනිවාර්ය**

සති 12

දිනය: අඟහරුවාද

වේලාව: පෙ.ව. 9:00-ප.ව. 12:00

ආරම්භය: ජනවාරි 9

සම්මාන: 3

කථිකාචාර්ය: **රවින් කල්දේරා**

### සභා ආකෘති

සෑම රටකම ඇති ක්‍රිස්තියානි සභාව ඔපවත්නේ එහි ඇති හරවත් විවිධවූ සම්ප්‍රදායන් නිසාය. මෙම පාඨමාලාව විවිධ ක්‍රිස්තියානි නිකායන්වල ආවේණික වූ සක්‍රමේන්තු, පොදු නමස්කාරය හා පරිපාලන සම්ප්‍රදායන්ගේ දේවධාර්මික හා ඓතිහාසික සම්භවය ගැන හැදෑරීමක් කරයි. විශ්ව සභාව තුළ ඇති විවිධත්වය අගය කිරීමට ශිෂ්‍යයා ඉගෙන ගනු ඇත.

**BTh අනිවාර්ය**

සති 10

දිනය: සිකුරාද

වේලාව: පෙ.ව. 9:00-ප.ව. 12:30

ආරම්භය: ජනවාරි 12

සම්මාන: 3

කථිකාචාර්ය: **රවින් කල්දේරා**

# 2 වාරය

# 2024 මැයි 6 - අගෝස්තු 3

○ පන්ති කාමරය තුළ | □ අන්තර්ජාලය හරහා | ★ මිශ්‍ර ශික්ෂණ මාධ්‍ය

# කාල සටහන - 2 වන වාරය

| වේලාව | සඳුදා | අඟහරුවාදා | බදාදා | බ්‍රහස්පතින්දා | සිකුරාදා | සෙනසුරාදා |
|---|---|---|---|---|---|---|
| උදෑසන | ○ **ක්‍රිස්තු ශාසනයේ ඉතිහාසය I**<br>පෙ.ව.9:00-පෙ.ව.11:15<br>ජී පී වී සෝමරත්න \| මධු මිහිරි ප්‍රනාන්දු | ○ **නායකත්වයේ ආකෘති**<br>පෙ.ව.9:00-ප.ව.12:00<br>රවින් කල්දේරා<br>○ **වෙනත් ආගම් අදහන්නන් සමඟ සබඳතා පැවැත්වීම**<br>පෙ.ව.9:00-පෙ.ව.11:00<br>සනත් අතුකෝරාළ | ○ **දේව වචනය පිළිබඳ සංකල්ප**<br>පෙ.ව.9:00-ප.ව.12:30<br>සනත් අතුකෝරාළ<br>සහභාගිකමේ කාලය<br>පෙ.ව.10:30-පෙ.ව.11:30 | ○ **ක්‍රිස්තුස් වහන්සේගේ පුද්ගලත්වය සහ කාර්යය**<br>පෙ.ව.9:00-ප.ව.12:30<br>රවින් කල්දේරා<br>දේව මෙහෙය<br>පෙ.ව.10:30-පෙ.ව.11:30 | □ **සමකාලීන මතවාද**<br>පෙ.ව.9:00-ප.ව.12:30<br>ප්‍රබෝ මිහිඳුකුලසූරිය \| සනත් අතුකෝරාළ<br>○ **එපිසවරුන්ට යැවූ හසුන**<br>පෙ.ව.9:00-පෙ.ව.11:30<br>ඊන්ස්ටීන් ප්‍රනාන්දු | ○ කෙටි කාලීන<br>**බිඳුණු හදට සුවය**<br>ජුනි<br>8-15-22-29<br>පෙ.ව.9:00-ප.ව.4:00<br>පත්මසීලි ගුණතිලක \| ක්‍රිස්ති එදිරිසිංහ |
| දහවල් | ○ **දේව සේවයේ ඇති අවධානම් හා උගුල්**<br>ප.ව.3:00-ප.ව.5:00<br>විමලසේන ජයලත් | ○ **ළමා සේවාවන් සඳහා නායකත්ව දැක්මක් ගොඩ නැංවීම**<br>ප.ව.3:00-ප.ව.5:00<br>ක්‍රිස්ති එදිරිසිංහ | ○ **1 සහ 2 රාජාවලිය**<br>ප.ව.3:00-ප.ව.5:00<br>නාමල් වීරසිංහ | ○ **උපදේශනයට හැඳින්වීම**<br>ප.ව.3:00-ප.ව.5:15<br>ඊන්ස්ටීන් ප්‍රනාන්දු | ○ **ගීතාවලිය ගවේෂණය කිරීම**<br>ප.ව.3:00-ප.ව.5:30<br>දුලිප් ප්‍රනාන්දු | |
| සවස | ★ **දේවගැති සේවය සඳහා කළමනාකරන මූලධර්මය**<br>ප.ව.6:00-ප.ව.8:00<br>මහින්ද මුණසිංහ | ★ **කිතුනු ආත්මිකතාව**<br>ප.ව.6:00-ප.ව.8:00<br>මිශෙල් පීරිස් | ★ **දැඩි කම්පනයට පත් දරුවන්ට සුවය සහ නව බලාපොරොත්තුව**<br>ප.ව.6:00-ප.ව.8:00<br>ශාලිනි රොඩ්‍රිගෝ | ★ **දුක්විඳීම පිළිබඳ දේවවේදය**<br>ප.ව.6:00-ප.ව.8:15<br>සරත් ද සිල්වා | □ **උත්පත්ති පොත**<br>ප.ව.6:00-ප.ව.8:30<br>රවින් කල්දේරා | |

*නොවැළැක්විය හැකි හේතු මත ප්‍රකාශිත කාල සටහන වෙනස් විය හැකිය. ලියාපදිංචි වීමට පෙර අධ්‍යයන කාර්යාලයෙන් විමසන්න.*

## 2 වන වාරය | 2024 මැයි 6 - අගෝස්තු 3

# උදෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## පන්ති කාමරය තුළ

### ක්‍රිස්තු ශාසනයේ ඉතිහාසය I

*ආරම්භයේ සිට ප්‍රතිසංස්කරණය දක්වා*

ක්‍රිස්තියානි සභාව ආරම්භයේ පටන් ප්‍රතිසංස්කරණය දක්වා කාලය අතරතුර මිනිසුන්ගෙන්ද සිද්ධීන්ගෙන්ද දේවධර්මයන්ගෙන්ද පෝෂණය වී හැඩ ගැසී පැමිණ ඇත. සභාවේ මුල් වසර 1400 තුළ බිහි වූ ප්‍රාණපරිත්‍යාගිවරු, තපස්වරු, ධර්මදූතයෝ සහ ප්‍රගමනයන් මෙම අධ්‍යයනයේ දී ඔබට මුණගැසෙනු ඇත.

BTh|Dip අනිවාර්ය

සති 11

දිනය: සඳුදා

වේලාව: පෙ.ව. 9:00-11:15

ආරම්භය: මැයි 13

සම්මාන: 2

කථිකාචාර්ය: **ජී පී වී සෝමරත්න | මධු මිහිරි ප්‍රනාන්දු**

### දේව සේවයේ ඇති අවධානම් හා උගුල්

සමහර දේව සේවකයන්ගේ අනවධානය හා අනවබෝධය නිසා සේවා දිවියේ අවදානම් හා උගුල්වලට හසු වී ස්වකීය සේවය, ඇදහිල්ල, චරිතය හා විටෙක ජීවිතය පවා විනාශ කර ගනියි. මෙම පාඨමාලාව තුළින් ඔබ දේව සේවයේ නියැළෙන විට මුහුණ දිය හැකි අන්තරාකාරී තත්වයන් හා ඔබ උගුල් පිළිබඳ අවබෝධයක් හා එවායින් ප්‍රවේශම් වන්නේ කෙසේදැයි අවබෝධයක් ගෙනේ.

BTh|Dip වෛකල්පික

සති 12

දිනය: සඳුදා

වේලාව: ප.ව. 3:00-5:00

ආරම්භය: මැයි 6

සම්මාන: 2

කථිකාචාර්ය: **විමලසේන ජයලත්**

### වෙනත් ආගම් අදහන්නන් සමඟ සබඳතා පැවැත්වීම

ප්‍රධාන ආගම් තුනකින් යුත් සමාජයක බලපෑමක් සහිතව ජීවත්වීම සඳහා කිතුනුවන්ට මෙම ආගම් සහ ඔවුන්ගේ සුවිශේෂී සංස්කෘතික ලක්ෂණ ගැන ගැඹුරු අවබෝධයක් තිබීම වැදගත් වේ. බෞද්ධ, හින්දු, මුස්ලිම් ආගම්වල මූලික සිද්ධාන්ත ඉගෙනීමටත් ඔවුන් සමග ගෞරවනීය සංවාදයකට එළඹීමටත් ඉගෙන ගත හැකිය. සමාදන වූ ශ්‍රී ලංකාවක් තුළ ඔබගේ කාර්යභාරය කුමක්ද? එන්න පැමිණ ගවේෂණය කරන්න.

BTh|Dip වෛකල්පික

සති 12

දිනය: අඟහරුවාදා

වේලාව: පෙ.ව. 9:00-11:00

ආරම්භය: මැයි 7

සම්මාන: 2

කථිකාචාර්ය: **සනත් අතුකෝරාළ**

### ළමා සේවාවන් සඳහා නායකත්ව දැක්මක් ගොඩ නැංවීම

දරුවන් අපගේ ඉදිරි අනාගතයයි. ඔවුන් දේව රාජ්‍යයේ ක්‍රියාශීලි පුරවැසියන් සහ සාඩම්බර චරිතාපදනක් ඇත්තන් ලෙස ගොඩ නැංවීම ළමා සේවා සලසන්නන්ගේ අභියෝගයය. සභාවේ සිටින දරුවන්ගේ සියලු සම්බන්ධතා සීමා කෙරෙන සමාජ සන්දර්භයන් තුළ දරුවන් අතර සේවය කරන්නා හට දර්ශනයක් මගින් බලගැන්වීම මෙම පාඨමාලාවේ අරමුණය.

BTh|Dip වෛකල්පික

සති 12

දිනය: අඟහරුවාදා

වේලාව: ප.ව. 3:00-5:00

ආරම්භය: මැයි 7

සම්මාන: 2

කථිකාචාර්ය: **ක්‍රිස්නි එදිරිසිංහ**

# 2 වන වාරය | 2024 මැයි 6 - අගෝස්තු 3
# උදෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා
## පන්ති කාමරය තුළ

### දේව වචනය පිළිබඳ සංකල්ප

**BTh|Dip වෛකල්පික**

මෙම පාඨමාලාව බයිබලයේ ගුණාංගයන් ගැන බොහෝ ප්‍රශ්නවලට පිළිතුරු සපයයි. දේව වචනය අපට ලැබුණේ කෙසේද? එහි කතුවරයන්ගේ පෞද්ගලිකත්වය සහ උත්සාහය දෙවියන් වහන්සේ යටපත් කළේද? බයිබලයේ නිරවද්‍යභාවයෙන් අදහස් වන්නේ කුමක්ද? දෙවියන් වහන්සේගේ එළිදරව්ව තුළ ආත්ම අවබෝධයටත්, සිත සැනසීමේදීත්, ඉගැන්වීමේදී සහ දේශනා කිරීමේදීත් බයිබලය භාවිත කිරීම ඉතා ප්‍රයෝජනවත් වේ.

සති 12

දිනය: බදාදා

වේලාව: පෙ.ව. 9:00-ප.ව. 12:30

ආරම්භය: මැයි 8

සම්මාන: 2

කථිකාචාර්ය: **සනත් අතුකෝරාළ**

### 1 සහ 2 රාජාවලිය

**BTh|Dip වෛකල්පික**

***පූර්ව විප්‍රවාසී ඉශ්රායෙල් නායකත්ව ආකෘති***

දාවිත් රජුගේ මරණින් පසු සලමොන් රජුගේ රාජ්‍යය හා එහි ඉතිහාස කතාව මෙහිදී ගෙනහැර දක්වයි. දේව අභිලාෂයන්ට අනුව ජීවත් වූවන් හා නොවූවන් ආදර්ශ කොට, අපගේ දිවිය තුළත් උන්වහන්සේගේ මගපෙන්වීම අනුව ක්‍රියාකළ හැකි අයුරු සිතීමට පූර්ව විප්‍රවාසී ඉශ්රායෙල් නායකත්ව ආකෘති තුළින් මගපෙන්වීමක් ගෙනේ.

සති 12

දිනය: බදාදා

වේලාව: ප.ව. 3:00-5:00

ආරම්භය: මැයි 8

සම්මාන: 2

කථිකාචාර්ය: **නාමල් වීරසිංහ**

### ක්‍රිස්තුස් වහන්සේගේ පුද්ගලත්වය සහ කාර්යය

**BTh|Dip අනිවාර්ය**

ජේසුස් වහන්සේගේ දේවත්වය හා මනුෂ්‍යත්වය පිළිබඳ උන්වහන්සේගේ පුද්ගලත්වය විග්‍රහ කිරීමට කිතුනු ශාසනය තුළ විශේෂ කුතුහලයක් හා සියවස් ගණනාවක් පුරා පැවත එන සංවාදයක් ඇත. ජේසුස් වහන්සේ පැමිණියේ කුමක් ඉටු කිරීමටද? මිනිසාගේ ගැළවීමට උන්වහන්සේගේ මරණය හා උත්ථානය වැදගත් වන්නේ කෙසේද? මෙම පාඨමාලාව තුළ ක්‍රිස්තුවේදය සහ විමුක්තිවේදය ගවේෂණයට ලක් කරනු ඇත.

සති 11

දිනය: බ්‍රහස්පතින්දා

වේලාව: පෙ.ව. 9:00-ප.ව. 12:30

ආරම්භය: මැයි 9

සම්මාන: 2

කථිකාචාර්ය: **රවින් කල්දේරා**

### උපදේශනයට හැඳින්වීම

**BTh|Dip අනිවාර්ය**

මානසික සහ චිත්තවේගී සහනය අවශ්‍යව සිටින්නාවූ පුද්ගලයන් අපට දෛනික ජීවිතයේදී මුණ ගැසේ. ඔවුන්ට උපකාර කරන පුද්ගලයෙකු ලෙස කිතුනුවෙකු සවිගත වන්නේ කෙසේද? උපදේශනය පිළිබඳ බයිබලීය ඉගැන්වීම් හැදෑරීම, අන් අයට උපකාර කිරීම සහ ඔවුන් පූර්ණත්වයට පත්කිරීමට අවශ්‍ය මූලික කුසලතා සම්බන්ධයෙන් හැඳින්වීමක් සිදු කෙරේ.

සති 11

දිනය: බ්‍රහස්පතින්දා

වේලාව: ප.ව. 3:00-5:15

ආරම්භය: මැයි 9

සම්මාන: 2

කථිකාචාර්ය: **ඊන්ස්ටීන් ප්‍රනාන්දු**

## 2 වන වාරය | 2024 මැයි 6 - අගෝස්තු 3
# උදෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා
### පන්ති කාමරය තුළ

| | |
|---|---|
| **එපිසවරුන්ට යැවූ හසුන**<br>එපිසවරුන්ට පාවුල් තුමා ලියූ හසුන 'පාවුල් තුමාගේ පරමසාරය' ලෙස හඳුන්වනු ලබන්නේ සාරාංශයක් ලෙස ගත්කල එමඟින් ක්‍රිස්තුස් වහන්සේ ඔහුට භාරදුන් ශුභාරංචියේ හරය දැක්වෙන නිසාය. එපීස පොත දෙස කරන්නා වූ මෙම නැවුම් බැලීම තුළ ගැළවීම, සභාව හා කිතුනු ජීවිතය කෙරෙහි වූ ඔබේ දැක්ම පරිනාමනයකට ලක්වනු ඇත. | **BTh\|Dip වෛකල්පික**<br>සති 10<br>දිනය: සිකුරාද<br>වේලාව: පෙ.ව. 9:00-11:30<br>ආරම්භය: මැයි 10<br>සම්මාන: 2<br>කථිකාචාර්ය: **ඊන්ස්ටීන් ප්‍රනාන්දු** |

| | |
|---|---|
| **ගීතාවලිය ගවේෂණය කිරීම**<br>විලියම් වැන්ගැමරන් මෙසේ පවසයි: 'ගීතාවලියේ කතුවරයා ආත්මයට ඔක්සිජන් සපයයි.' ගීතාවලියේ වූ විවිධ ගීතිකා අර්ථකථනය කිරීම, වැලපීමෙන් දෙවියන් වහන්සේට කථා කරන ආකාරය, නමස්කාරය මෙන්ම දෙවියන් වහන්සේ පිළිබඳ විස්තරය ආදි දේ ඉශ්රායෙල් ගීතිකා පොත ගවේෂණය කිරීමෙන් ඉගෙන ගත හැකිය. | **BTh\|Dip වෛකල්පික**<br>සති 10<br>දිනය: සිකුරාද<br>වේලාව: ප.ව. 3:00-5:30<br>ආරම්භය: මැයි 10<br>සම්මාන: 2<br>කථිකාචාර්ය: **දුලිප් ප්‍රනාන්දු** |

## 2 වන වාරය | 2024 මැයි 6 - අගෝස්තු 3
# සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා
### අන්තර්ජාලය හරහා

| | |
|---|---|
| **උත්පත්ති පොත**<br>පටන් ගැන්ම පිළිබඳ ගැඹුරු අධ්‍යයනයකි. උත්පත්ති පොතෙහි සංස්කෘතික සහ ඓතිහාසික පසුබිම තුළ විචාරණාත්මක ඉගැන්වීමක් ගෙනේ. විශ්වයේද මිනිසාගේ ද ඉශ්රායෙල් ජනතාවගේද පාපය සහ ගැළවීමේද ආරම්භය ලියා ඇති පොත ලියැවී ඇති පසුබිම එහි සැකැස්ම, තේමාවන් සහ පණිවිඩය විමර්ශනය කෙරේ. | **BTh අනිවාර්ය**<br>**Dip වෛකල්පික**<br>සති 10<br>දිනය: සිකුරාද<br>වේලාව: ප.ව. 6:00-8:30<br>ආරම්භය: මැයි 10<br>සම්මාන: 2<br>කථිකාචාර්ය: **රවින් කල්දේරා** |

## 2 වන වාරය | 2024 මැයි 6 - අගෝස්තු 3

# සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## මිශ්‍ර ශික්ෂණ මාධ්‍ය

### දේවගැති සේවය සඳහා කළමනාකරන මූලධර්මය

දේව සේවය තුළ කැපීපෙනනෙන සේ වෙනස් වූ විවිධ භූමිකා පිළිබඳ කළමනාකාරීත්වයක් නැති විට සේවය තුළ ඉමහත් අර්බුධ හා ගැටලු පැණ නගී. මෙම පාඨමාලාව තුළින් පෞද්ගික ලෙස තමුන් ගේ භූමිකාවන් කළමනාකරණය කිරීමටත්, සේවා කටයුතු විධිමත් හා සැලසුම් සහගත ලෙස කිරීම සඳහා අත්වැලක් සපයයි.

BTh | Dip වෛකල්පික

සති 12

දිනය: සඳුද

වේලාව: ප.ව. 6:00-8:00

ආරම්භය: මැයි 6

සම්මාන: 2

කථිකාචාර්ය: **මහින්ද මුණසිංහ**

### කිතුනු ආත්මිකතාව

දෙවියන් වහන්සේ සමග සමීප සබදතාවක් ඔබට ඇතිකර ගත හැක්කේ කෙසේද යන්න පැමිණ ඉගෙනගන්න. ඔබගේ හැකියාවන්, කාලය, පෞරුෂත්වය ඔබ ප්‍රයෝජනයට ගත යුතු ආකාරය දෙවියන් වහන්සේට අවශ්‍ය වන්නේ කෙසේද යන්න දැනගන්න. ඔබගේ මුළු හදවතින්, ශක්තියෙන්, ආත්මයෙන් හා ප්‍රාණයෙන් උන්වහන්සේට ප්‍රේම කරන්නේ කෙසේදැයි ඉගෙනගන්න.

BTh | Dip වෛකල්පික

සති 12

දිනය: අඟහරුවාද

වේලාව: ප.ව. 6:00-8:00

ආරම්භය: මැයි 7

සම්මාන: 2

කථිකාචාර්ය: **මිශෙල් පීරිස්**

### දැඩි කම්පනයට පත් දරුවන්ට සුවය සහ නව බලාපොරොත්තුව

අධ්‍යයන ක්‍රමවේද කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ වර්තමාන වාර්තාවලට අනුව ලංකාවේ ළමුන් පෙර නොවූ විරූ අයුරින් කම්පනයට හා චිත්තවේගයන්ට පත්වී ඇත. කොළඹින් පිටත අසන නඩුවලින් වැඩි ප්‍රමාණයක් ළමා අපයෝජන සම්බන්ධවය. ශාරීරික, මානසික සහ ලිංගික අතවරයන්ට මුහුණ දුන් ළමුන් හට සේවය කිරීම සඳහා ඔබ සන්නද්ධ කරයි.

BTh | Dip වෛකල්පික

සති 12

දිනය: බදාද

වේලාව: ප.ව. 6:00-8:00

ආරම්භය: මැයි 8

සම්මාන: 2

කථිකාචාර්ය: **ශාලිනි රොඩ්‍රිගෝ**

### දුක්විඳීම පිළිබඳ දේවවේදය

දුක සැමට ම පොදු ය. එයින් කිසිවෙකු මිදී නැත. දුක් අප තුළ ඇති අනර්ඝ දෑ මතු කරවීම හෝ ඇදහිල්ලේ අර්බුදයකට යොමු කරයි. දුක් විඳීම පිළිබඳ දේවවේදය බයිබලීය ඇසකින් බලා කිතුනුවන් ලෙස පෞද්ගලික හා ලෝකයේ ඇති දුක් සඳහා ප්‍රතිචාරයකට යොමු කරවයි.

BTh | Dip වෛකල්පික

සති 11

දිනය: බ්‍රහස්පතින්ද

වේලාව: ප.ව. 6:00-8:15

ආරම්භය: මැයි 9

සම්මාන: 2

කථිකාචාර්ය: **සරත් ද සිල්වා**

## 2 වන වාරය | 2024 මැයි 6 - අගෝස්තු 3

# කෙටි කාලීන පාඨමාලා

## පන්ති කාමරය තුළ

| | |
|---|---|
| **බිඳුණු හදට සුවය**<br>චිත්තවේගී ප්‍රකම්පනය යනු සුවවීමට කාලය ගතවන හදවතේ සහ මනසේ තුවාලයකි. එය අපගේ සෑම කොටසකටම: අපගේ සම්බන්ධතා, අපගේ ශරීර, අපගේ සිතුවිලි සහ අපගේ ඇදහිල්ල යනාදියට වේදනා ඇති කරයි. මෙම පාඨමාලාවේ පරමාර්ථය වන්නේ වේදනාකාරී හා කම්පන සහගත අත්දැකීම්වල බලපෑම පිළිබඳ අවබෝධයක් ලබා දීම සහ මෙම වේදනාවෙන් සුවය ලැබීමට ආරක්ෂිත ස්ථානයක් ලබා දීම මෙන්ම එම සුවවීමේ ගමන හරහා අනෙක් පුද්ගලයන්ට මඟ පෙන්විය හැකි පහසුකම් සපයන්නන් බවට පත් කිරීමට නායකයන් සන්නද්ධ කිරීමයි. | කෙටි කාලීන **BTh\|Dip වෛකල්පික**<br><br>ජුනි මාසයේ සෙනසුරාද 4ක්<br><br>දින: 8-15-22-29<br><br>වේලාව: පෙ.ව. 9:00-ප.ව.4:00<br><br>සම්මාන: 2<br><br>කථිකාචාර්ය:<br>**පත්මසීලි ගුණතිලක \| ක්‍රිස්ති එදිරිසිංහ** |

## 2 වන වාරය | 2024 මැයි 6 - අගෝස්තු 3
# දේවධර්ම උපාධි සම්මන්ත්‍රණ

මෙම සම්මන්ත්‍රණ සකසා ඇත්තේ උපාධිය හෝ ශාස්ත්‍රපති වැඩසටහන්වලට ලියාපදිංචි වූ අය සඳහාය. පංති කාමරයක වැනි සැකැස්ම දේශනයක් හා සම්මන්ත්‍රණයක් අමතර සමබරතාවය ඇත. අමතර කියවීම් හා පර්යේෂණ මත පදනම්ව සිසුන් සාකච්ඡා සඳහා පත්‍රිකා සකස් කළ යුතුය.
උපාධි පාඨමාලාවේ ලියාපදිංචිය හා සම්මාන 60 සම්පූර්ණ කර තිබීම පූර්ව අවශ්‍යතාවන්ය.

## පන්ති කාමරය තුළ

| | |
|---|---|
| **නායකත්වයේ ආකෘති**<br>නායකත්වය විවිධාකාරය. විමුක්තිදායක සත්‍යය අවබෝධ කර ගන්න. දාර්ශනික නායකයින්, කළමනාකරණ නායකයින්, එඬේර නායකයින්, කණ්ඩායම් ගොඩනඟන නායකයින් සහ ව්‍යාපාරික නායකයින් මෙයින් සමහරක් ය. ඔබ සතුව ඇති සුවිශේෂී නායකත්ව ස්වභාවය හඳුනාගන්නේ කෙසේද? ඔබගේ කණ්ඩායමට වෙනත් නායකයින් අවශ්‍ය ඇයි? තමන්ගේ සේවය ලබන්නවුන්ගේ යහපත වෙනුවෙන් විවිධ නායකයින් ක්‍රියා කරනුයේ කෙසේද? | සති 12 **BTh අනිවාර්ය**<br>දිනය: අඟහරුවාද<br>වේලාව: පෙ.ව. 9:00-ප.ව. 12:00<br>ආරම්භය: මැයි 7<br>සම්මාන: 3<br>කථිකාචාර්ය: **රවින් කල්දේරා** |

## අන්තර්ජාලය හරහා

| | |
|---|---|
| **සමකාලීන මතවාද**<br>මතවාද විසින් මිනිසා සිතන ආකාරයත් ජීවත්වන විධියත් බලවත් ලෙස නිර්ණය කරයි. ශුභාරංචිය අර්ථවත් ලෙස සන්නිවේදනය කිරීමට නම් මෙම නිර්ණායකයන්ගෙන් එල්ලවන අභියෝගය පිළිබඳ හොඳ අවබෝධයක් තිබිය යුතුය. | සති 10 **BTh අනිවාර්ය**<br>දිනය: සිකුරාද<br>වේලාව: පෙ.ව. 9:00-ප.ව. 12:30<br>ආරම්භය: මැයි 10<br>සම්මාන: 3<br>කථිකාචාර්ය:<br>**ප්‍රබෝ මිහිඳුකුලසූරිය \| සරත් ද සිල්වා** |

# 3 වාරය

# 2024 සැප්තැම්බර් 2 - නොවැම්බර් 30

● පන්ති කාමරය තුළ | ◻ අන්තර්ජාලය හරහා | ★ මිශ්‍ර ශික්ෂණ මාධ්‍ය

# කාල සටහන - 3 වන වාරය

| වේලාව | සඳුදා | අඟහරුවාදා | බදාදා | බ්‍රහස්පතින්දා | සිකුරාදා |
|---|---|---|---|---|---|
| උදෑසන | ● **ක්‍රිස්තු ශාසනයේ ඉතිහාසය II**<br>පෙ.ව.9:00-පෙ.ව.11:30<br>ජී පී වී සෝමරත්න \|<br>මධු මිහිරි ප්‍රනාන්දු | ● **සේවය සඳහා ආචාරධර්ම**<br>පෙ.ව.9:00-ප.ව.12:15<br>සරත් ද සිල්වා | ● **දූතනය පිළිබඳ දේවධර්මය**<br>පෙ.ව.9:00-ප.ව.12:30<br>සනත් අතුකෝරාළ<br>සහභාගිකමේ කාලය<br>පෙ.ව.10:30-පෙ.ව.11:30 | ● **පැරණි ගිවිසුම් පසුබිම**<br>පෙ.ව.9:00-ප.ව.12:30<br>චමිලා සුභාෂ් රණසිංහ<br>දේව මෙහෙය<br>පෙ.ව.10:30-පෙ.ව.11:30 | ◻ **ප්‍රධාන දේවවේද සම්ප්‍රදායන් ගවේෂණය**<br>පෙ.ව.9:00-ප.ව.12:30<br>ප්‍රබෝ මිහිඳුකුලසූරිය<br>● **ආමොස් පොත**<br>පෙ.ව.9:00-පෙ.ව.11:30<br>ඊන්ස්ටීන් ප්‍රනාන්දු |
| දහවල් | ● **මාර්ගෝපදේශක නායකයන්**<br>ප.ව.3:00-ප.ව.5:15<br>විමලසේන ජයලත් | ● **පොදු ගැටලු සඳහා උපදේශනය**<br>ප.ව.3:00-ප.ව.5:15<br>ඊන්ස්ටීන් ප්‍රනාන්දු | ● **කිතුනු සේවකයෙකුගේ ජීවිතය සහ කාර්යය**<br>ප.ව.3:00-ප.ව.5:00<br>දුලිප් ප්‍රනාන්දු | ● **සංස්කෘතිය, ජනවාර්ගය සහ අනන්‍යතාවය**<br>ප.ව.3:00-ප.ව.5:15<br>ක්‍රිස්නි එදිරිසිංහ | |
| සවස | ★ **සභාව, රාජ්‍යය සහ සමාජය**<br>ප.ව.6:00-ප.ව.8:15<br>මහින්ද මුණසිංහ | ◻ **එළිදරව් පොත**<br>ප.ව.6:00-ප.ව.8:15<br>සනත් අතුකෝරාළ | ● **ලොවට පියෙක් අවශ්‍යයි**<br>ප.ව.6:00-ප.ව.8:00<br>නිරෝෂන් පෙරේරා \|<br>ක්‍රිස්නි එදිරිසිංහ | ★ **විද්‍යාව සහ ඇදහිල්ල**<br>ප.ව.6:00-ප.ව.8:15<br>සනත් අතුකෝරාළ | ◻ **අධ්‍යයන ක්‍රමවේද**<br>ප.ව.6:00-ප.ව.8:30<br>රවින් කල්දේරා |

*නොවැළැක්විය හැකි හේතු මත ප්‍රකාශිත කාල සටහන වෙනස් විය හැකිය. ලියාපදිංචි වීමට පෙර අධ්‍යයන කාර්යාලයෙන් විමසන්න.*

3 වන වාරය | 2024 සැප්තැම්බර් 2 - නොවැම්බර් 30

# උදෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## පන්ති කාමරය තුළ

### ක්‍රිස්තු ශාසනයේ ඉතිහාසය II

*ප්‍රතිසංස්කරණයේ සිට 1900 දක්වා*

ප්‍රතිසංස්කරණ යුගයේ සිට (1517) නූතන ධර්මදූත ව්‍යාපාරය (1900) දක්වා කාලයේ බිහි වූ ශ්‍රේෂ්ඨ ප්‍රතිසංස්කරණවාදීන්, චතුර දේවධර්මවේදීන් සහ උත්සාහවන්ත ධර්මදූතයින්ගේ මුල පිරීමෙන් ලෝක ව්‍යාප්ත කිතුනු ප්‍රජාවක් ගොඩනැගේ. මෙම පාඨමාලාවෙන් ශතවර්ෂ හතරක සසුන් ඉතිහාසය වත්මන් කිතුනු සභාවට අදාළ වන්නේ කෙසේදැයි තේරුම් ගැනීමට උපකාරී වනු ඇත.

**BTh|Dip අනිවාර්ය**

සති 10

දිනය: සඳුද

වේලාව: පෙ.ව. 9:00-11:30

ආරම්භය: සැප්තැම්බර් 9

සම්මාන: 2

කථිකාචාර්ය: **ජී පී වී සෝමරත්න | මධූ මිහිරි ප්‍රනාන්දු**

### මාර්ගෝපදේශක නායකයන්

මාර්ගෝපදේශනය මගින් නව නායකයන් හට දෙවියන් වහන්සේ ප්‍රධානය කරන ලද දීමනා මතු කොට ගෙනේ. මෙම පාඨමාලාව තුළින් මාර්ගෝපදේශනය සඳහා භාවිත වන ආකෘතීන් හා යේසුස් වහන්සේ භාවිත කළ ආකෘතිය අධ්‍යයනය කිරීම මගින් ඔබගේ අත්දැකීම් කුසලතා හා අවබෝධය පුළුල් |කෙරේ.

**BTh|Dip වෛකල්පික**

සති 11

දිනය: සඳුද

වේලාව: ප.ව. 3:00-5:15

ආරම්භය: සැප්තැම්බර් 2

සම්මාන: 2

කථිකාචාර්ය: **විමලසේන ජයලත්**

### පොදු ගැටලු සඳහා උපදේශනය

දුක, ශෝකය, මානසික අසහනය, කාංසාව, හීනමානය, කේන්තිය, ඇබ්බැහිවීම් යනාදී දහසකුත් ප්‍රශ්නවල සමාජය ගිලී ඇත. මෙම ප්‍රශ්න ක්‍රිස්තියානි පවුල්වලට ද බලපායි. මෙවැනි වාතාවරණයක ගිලී සිටින පිරිසට අත්වැලක් වීමට අවශ්‍ය නිපුණතාව ඔබට ලැබෙනු ඇත.

**BTh|Dip වෛකල්පික**

සති 11

දිනය: අඟහරුවාද

වේලාව: ප.ව. 3:00-5:15

ආරම්භය: සැප්තැම්බර් 3

සම්මාන: 2

කථිකාචාර්ය: **ඊන්ස්ටීන් ප්‍රනාන්දු**

### දූතනය පිළිබඳ දේවධර්මය

දූතනය බයිබලය පුරා පැතිරී ඇති මාතෘකාවකි. ලෝකය පිළිබඳ දෙවියන් වහන්සේගේ කැමැත්ත උත්පත්ති 1 හි එළිදරව් කර ඇති අතර ලොවට ගැළවීම ගෙනෙන පොරොන්දුවක් උත්පත්ති 3 හි සඳහන් වී ඇත. ධර්මදූතනයේ තේමාව සොයා යෑමේදී ආබ්‍රහම්ගේ කැඳවීම, ඉශ්රායලයේ කැඳවීම, යේසුස් වහන්සේගේ දූතනය, ක්‍රියා පොත මගින් ගෙනෙන දයකත්වය වැනි මාතෘකා මෙම පාඨමාලාවේදී හඳරනු ලැබේ.

**BTh|Dip වෛකල්පික**

සති 12

දිනය: බදාද

වේලාව: පෙ.ව. 9:00-ප.ව. 12:30

ආරම්භය: සැප්තැම්බර් 4

සම්මාන: 2

කථිකාචාර්ය: **සනත් අතුකෝරාළ**

## 3 වන වාරය | 2024 සැප්තැම්බර් 2 - නොවැම්බර් 30

# උදෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## පන්ති කාමරය තුළ

### කිතුනු සේවකයෙකුගේ ජීවිතය සහ කාර්යය

කිතුනු සේවකයෙකු වීමේ අද්විතීය කැඳවීම තේරුම් ගැනීමට උපකාරී වන විෂයකි. ප්‍රාදේශීය සභාවේ ද සමාජයේ ද උද්යෝගීමත්, බලවත් සේවකයෙකු විය හැක්කේ කෙසේද? නායකයෙකු ලෙස වර්ධනය වන අතරම, ආත්මික ජීවිතය ද ශක්තිමත් පවුල් සබඳතාවයක් ද තබා ගන්නා ආකාරය ඉගෙනීමට අවස්ථාව ලැබේ.

BTh|Dip වෛකල්පික

සති 12

දිනය: බදාදා

වේලාව: ප.ව. 3:00-5:00

ආරම්භය: සැප්තැම්බර් 4

සම්මාන: 2

කථිකාචාර්ය: **දුලිප් ප්‍රනාන්දු**

### පැරණි ගිවිසුම් පසුබිම

පරණ ගිවිසුමේ පොත්වල සාරවත් හා වර්ණවත් පසුබිම මෙම පාඨමාලාවේදී පැහැදිලි කෙරේ. පුරාණ මැත පෙරදිග තිබූ සංස්කෘතිය, ආගම් හා එහි ඉතිහාසය ගවේෂණය තුළින් පරණ ගිවිසුම නව ආකාරයෙන් සජීවීව ඔබට දැකගත හැකිවනු ඇත.

BTh|Dip අනිවාර්ය

සති 11

දිනය: බ්‍රහස්පතින්දා

වේලාව: පෙ.ව. 9:00-ප.ව. 12:30

ආරම්භය: සැප්තැම්බර් 5

සම්මාන: 2

කථිකාචාර්ය:

**චමිලා සුභාෂ් රණසිංහ**

### සංස්කෘතිය, ජනවාර්ගිකත්වය සහ අනන්‍යතාවය

අපගේ අනන්‍යතාවය ගොඩනැගී ඇත්තේ ජනවාර්ගිකත්වය හා ස්ත්‍රී පුරුෂ භාවය ඇතුලු විවිධ අනන්‍යතා ලක්ෂණ එකතුවකිනි. සංස්කෘතිය හා අප පිළිබඳ අන් අයගේ ප්‍රකාශයන් අපගේ හැඩගැස්ම තීරණය කරන සාධකයන්ය. එම අනන්‍යතා ලක්ෂණ ඉගෙනගැනීම හා ක්‍රිස්තුන් වහන්සේ තුළ අපගේ අනන්‍යතාව අවබෝධ කරගැනීම මත අපට වෙනස් අය සමග ක්‍රියා කිරීමේ දී සිතිය යුත්තේ කෙසේදැයි මෙම පාඨමාලාව ගවේෂණය කරනු ඇත.

BTh|Dip වෛකල්පික

සති 11

දිනය: බ්‍රහස්පතින්දා

වේලාව: ප.ව. 3:00-5:15

ආරම්භය: සැප්තැම්බර් 5

සම්මාන: 2

කථිකාචාර්ය: **ක්‍රිස්නි එදිරිසිංහ**

### ආමොස් පොත

අපගේ සමාජයේ පෙර නොවූ විරූ ලෙස දූෂණය, අසාධාරණය සහ ප්‍රචණ්ඩත්වය දක්නට ලැබේ. දෙවියන් වහන්සේට හිමි ගෞරවය ලැබෙන ලෙස සමාජය පරිවර්තනය පිණිස අප කෙසේ ප්‍රතිචාර දැක්විය යුතුද? ආමොස් පොත විස්මය ජනක ලෙස කාලීන වැදගත්කමක් ඇති හෙයින් කිතුනුවන්ට ප්‍රයෝජනවත් බයිබලීය පොතකි.

BTh|Dip වෛකල්පික

සති 10

දිනය: සිකුරාදා

වේලාව: පෙ.ව. 9:00-11:30

ආරම්භය: සැප්තැම්බර් 6

සම්මාන: 2

කථිකාචාර්ය: **ඊන්ස්ටීන් ප්‍රනාන්දු**

3 වන වාරය | 2024 සැප්තැම්බර් 2 - නොවැම්බර් 30

# සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## පන්ති කාමරය තුළ

| | |
|---|---|
| **ලොවට පියෙක් අවශ්‍යයි**<br>නූතන සමාජ ව්‍යසනයක් වන්නේ පවුලෙහි පිය අභාසය නොමැති වීම හෝ ඌනතාවය ය. පවුලක් තුළ දරුවන් මැනවින් වැඩීම සඳහා පිය භූමිකාව අතිශයින් වැදගත් වෙයි. කැසී කාර්ස්ටන් විසින් නිර්මාණය කරන ලද පාඨමාලාවක් තුළින් පවුලේ පියකු වීමේ ආකාරය මැනවින් මතු කරමින්, ස්වර්ගය පොළොවෙහි කිතුනු පවුලක් තුළින් නිර්මාණ කරන ආකාරය මේ පාඨමාලිවෙන් උගත හැකිය. | **BTh\|Dip වෛකල්පික**<br>සති 12<br>දිනය: බදාදා<br>වේලාව: ප.ව. 6:00-8:00<br>ආරම්භය: සැප්තැම්බර් 4<br>සම්මාන: 2<br>කථිකාචාර්ය: **නිරෝෂන් පෙරේරා \| ක්‍රිස්ති එදිරිසිංහ** |

## අන්තර්ජාලය හරහා

| | |
|---|---|
| **එළිදරව් පොත**<br>ස්වාමීවූ යේසුස් වහන්සේගේ දෙවන පැමිණීම, දෙවියන් වහන්සේගේ බලය සහ අඳුරු බලවේග අතර ගැටුම පවතින කාලය සහ මිනිස් ඉතිහාසයේ දෙවියන් වහන්සේගේ ක්‍රියාවන්හි ක්‍රියාශීලීත්වය පිළිබඳව මෙහිදී උගන්වනු ඇත. | **BTh\|Dip වෛකල්පික**<br>සති 11<br>දිනය: අඟහරුවාදා<br>වේලාව: ප.ව. 6:00-8:15<br>ආරම්භය: සැප්තැම්බර් 3<br>සම්මාන: 2<br>කථිකාචාර්ය: **සනත් අතුකෝරාළ** |

| | |
|---|---|
| **අධ්‍යයන ක්‍රමවේද**<br>අධ්‍යයන ක්‍රමවේද කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ මෙහෙවරෙහි දක්වන කරුණක් වන්නේ 'උසස්ම ශාස්ත්‍රීය ප්‍රමිතියට අනුව...' අපගේ පුහුණුව කරන බවය. එහෙයින් මෙම පාඨමාලාව කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ විෂය නිර්දේශයන්හි අවශ්‍යතාවන් පැහැදිලි කර දෙන අතර කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ සිසුවෙකු ලෙස විශිෂ්ටත්වයට පත් වීමට ඇවැසි සටහන් තබාගැනීමේ හැකියාව, වේගයෙන් කියවීම, පර්යේෂණ කිරීම, රචනා ලිවීම ආදී කුසලතාවන්ගෙන් ඔබ පූර්ණ කරනු ලබයි. | **BTh\|Dip අනිවාර්ය**<br>සති 10<br>දිනය: සිකුරාදා<br>වේලාව: ප.ව. 6:00-8:30<br>ආරම්භය: සැප්තැම්බර් 6<br>සම්මාන: 0 (2)<br>කථිකාචාර්ය: **රවින් කල්දේරා** |

## 3 වන වාරය | 2024 සැප්තැම්බර් 2 - නොවැම්බර් 30
# සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා
## මිශ්‍ර ශික්ෂණ මාධ්‍ය

### සභාව, රාජ්‍යය සහ සමාජය

කිතුනුවන් ලෝකය සමග සම්බන්ධ වීමේදී දෙවියන් වහන්සේට ඇති පක්ෂපාතී බව රැකගත යුතුයැයි යේසුස් වහන්සේ ආඥා කළ සේක. රාජ්‍යය සමග සබඳතා ඇතිකර ගැනීම හා සමාජයට බලපෑමක් ඇතිකරලීමට අවශ්‍යය අවංක දැහැමි සිතින් මේ දෙය කරන්නේ කෙසේද? මෙම පාඨමාලාව සභාව, රාජ්‍යය සහ සමාජය සමග සබඳතා පැවැත්විය යුතු ආකාරය පිළිබඳ රාමුවක් සපයයි.

**BTh|Dip වෛකල්පික**

සති 11

දිනය: සඳුද

වේලාව: ප.ව. 6:00-8:15

ආරම්භය: සැප්තැම්බර් 2

සම්මාන: 2

කථිකාචාර්ය: **මහින්ද මුණසිංහ**

### විද්‍යාව සහ ඇදහිල්ල

විද්‍යාව මගින් ඇදහිල්ල අහකට දමා ඇද්ද? නොඑසේනම් ඒවා සම්පූර්ණ වෙනස් අත්දැකීම්ද? එසේත් නැතිනම් විද්‍යාව ඇදහිල්ල පාවිච්චි කරත්ද? මෙම පාඨමාලාව තුළදී ඉහත කී ප්‍රශ්න සාකච්ඡාවට භාජනය වේ. ඇතැම් ශ්‍රේෂ්ඨ කතුවරයින්ගේ ලියවිලි අධ්‍යයනය කිරීමෙන් විද්‍යාව සහ ඇදහිල්ල අතර සංවාදය තේරුම් ගැනීමට ශිෂ්‍යයා හට හැකියාව ලැබෙනු ඇත.

**BTh|Dip වෛකල්පික**

සති 11

දිනය: බ්‍රහස්පතින්ද

වේලාව: ප.ව. 6:00-8:15

ආරම්භය: සැප්තැම්බර් 5

සම්මාන: 2

කථිකාචාර්ය: **සනත් අතුකෝරාළ**

## 3 වන වාරය | 2024 සැප්තැම්බර් 2 - නොවැම්බර් 30

# දේවධර්ම උපාධි සම්මන්ත්‍රණ

මෙම සම්මන්ත්‍රණ සකසා ඇත්තේ උපාධිය හෝ ශාස්ත්‍රපති වැඩසටහන්වලට ලියාපදිංචි වූ අය සඳහාය. පංති කාමරයක වැනි සැකැස්ම දේශනයක් හා සම්මන්ත්‍රණයක් අමතර සමබරතාවය ඇත. අමතර කියවීම් හා පර්යේෂණ මත පදනම්ව සිසුන් සාකච්ඡා සඳහා පත්‍රිකා සකස් කළ යුතුය.
උපාධි පාඨමාලාවේ ලියාපදිංචිය හා සම්මාන 60 සම්පූර්ණ කර තිබීම පූර්ව අවශ්‍යතාවන්ය.

## පන්ති කාමරය තුළ

| | |
|---|---|
| **සේවය සඳහා ආචාරධර්ම**<br>මුදල්, කාමුකත්වය, බලය යන දේවල් හේතුකොටගෙන ක්‍රිස්තියානි සභාව තුළ බිඳ වැටීම් සහ තමා දැන කරන විෂම ක්‍රියා මෑත කාලයේ දක්නට තිබේ. මුදල්, කාමුක ආශාවන් සහ බලය නිසා සේවයේදී ඇතිවන සදාචාරාත්මක උපද්‍රවයන් පිළිබඳ දැනීමක් ලබාදීම මෙහි අරමුණය. මෙම කරුණුවලින් ඔබගේ සේවය ආරක්ෂා කරගැනීමට ක්‍රම සහ විධි ඇතිකරලීමටත් ඒවා ක්‍රියාවේ යෙදවීමටත් ඔබ විසින් උගෙන ගනු ඇත. | **BTh අනිවාර්ය**<br>සති 11<br>දිනය: අඟහරුවාද<br>වේලාව: පෙ.ව. 9:00-ප.ව. 12:15<br>ආරම්භය: සැප්තැම්බර් 3<br>සම්මාන: 3<br>කථිකාචාර්ය: **සරත් ද සිල්වා** |


## අන්තර්ජාලය හරහා

| | |
|---|---|
| **ප්‍රධාන දේවවේද සම්ප්‍රදායන් ගවේෂණය**<br>ස්වතන්ත්‍රවාදී දේවධර්මය හා විමුක්තිය අතර වෙනස කුමක්ද? ධර්මදනී සම්ප්‍රදයේ විශේෂාංග මොනවාද? රෙපරමාදු දේවධර්මයේ පදනම් මොනවාද? කිතුනු නිකායන් බොහෝ විට දේවධාර්මික සම්ප්‍රදයන් මත පිහිටුවා ඇති අතර නිකාය භේදයටද හේතුවී ඇත. සෑම ප්‍රධාන දේවධර්ම සම්ප්‍රදයකම මුලාරම්භය ව්‍යාප්තිය හා නියෝජිත දේවධර්මවේදීන් පිළිබඳ සොයා දැනගැනීමටත්, එක් එක් සම්ප්‍රදයේ සාධනීය හා නිෂේධනීය පැතිකඩයන් ඇගැයීමටත් ශිෂ්‍යයන්ට අවස්ථාව ලැබෙනු ඇත. | **BTh අනිවාර්ය**<br>සති 10<br>දිනය: සිකුරාද<br>වේලාව: පෙ.ව. 9:00-ප.ව. 12:30<br>ආරම්භය: සැප්තැම්බර් 6<br>සම්මාන: 3<br>කථිකාචාර්ය: **ප්‍රබෝ මිහිඳුකුලසූරිය** |

# කථිකාචාර්යවරුන්ගේ විස්තර




**මහින්ද මුණසිංහ,** BTh, MA
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියකු වන අතර කැම්පස් කෲසේඩ් ෆොර් ක්‍රයිස්ට් සහ නැවිගේටර්ස් ආයතනයන් හි දිගු කලක් සේවය කර ඇත. පිලිපීනයේ ජාත්‍යන්තර නායකත්ව පිළිබඳ විද්‍යාලයේ (IGSL) පරිවර්තනාත්මක නායකත්වය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත. මෙතෝදිස්ත සභාවේ ගිහි නායකයෙක් සහ පූර්ණ ගිහි දේශකයෙක් ලෙස සේවය කරන අතර වර්තමානයේ ගෝලයන් ගොඩනැගීමේ සේවාවේ නියුක්තව සිටි.



**විමලසේන ජයලත්,** BTh, LDD, MA
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකි. සිව්චතුරස්‍ර සභාවේ මධ්‍යම පළාතේ වැඩ බලන දේවගැතිවරයා ලෙස ද එම සභාවේ කමිටු සාමාජිකයෙකු හා කිතුනු අධ්‍යාපන අංශයේ අධ්‍යක්ෂකවරයෙකු ලෙස ද සේවය කරයි.



**ඇන්තනි සයිමන්,** BTh
කොළඹ දේවධර්ම දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකි. වසර 23 ක කාලයක සිට ප්‍රසංසා යාච්ඤා ලංකා සභාවේ පුරෝගාමී සේවයේ යෙදී සිටින්නේය. වසර 28ක පූර්ණකාලීන සේවය තුළ ලාංකීය සභාවේ විවිධ සේවාවන්වලට නායකත්වය ලබා දී ඇත.



**සනත් අතුකෝරාළ,** BSc, BTh, MA (Hons), PhD
**කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ අධ්‍යාත්මික ගොඩනැගීම් සම්බන්ධීකාරකවරයාය.** කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරයෙකු වන මෙතුමා ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ජෛව විද්‍යාව පිළිබඳ උපාධියද, ටෝච් ට්‍රිනිටි විශ්වවිද්‍යාලයේ ක්‍රිස්තියානි අධ්‍යාපනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (2007) සහ අධ්‍යාපන අධ්‍යයනය පිළිබඳ ආචාර්ය උපාධිය (2020) ද ලබා ඇත. වසර 20 කටත් වැඩි දේව සේවයේ හා ඉගැන්වීමේ සේවයේ පළපුරුද්දක් ඇති අතර මෙතුමා සියලු ජාතීන්ගේ සභාවේ සාමාජිකයෙකි.



**ඊන්ස්ටීන් ප්‍රනාන්දු,** HND (Counselling), BTh, PgDip (BAPC)
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකු හා ගුරු මණ්ඩල සාමාජිකයෙකි. කිතුසෙවණ සේවයේ දේවගැතිවරයෙකු ලෙස ද ගෝලත්ව මධ්‍යස්ථානයේ ගුරුවරයෙක් හා උප විදුහල්පතිවරයෙක් ලෙස ද කටයුතු කර තිබේ. උපදේශන කටයුතුවල නිරත වන අතර ශ්‍රී ලංකා පදනම් ආයතනයෙන් උසස් ජාතික උපදේශන ඩිප්ලෝමාව ලබාගත්තේය.

# කථිකාචාර්යවරුන්ගේ විස්තර



**නාමල් වීරසිංහ,** BTh
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකි. යෞවන කිතුමග සංවිධානයේ හි (Youth For Christ) වසර 24ක පූර්ණකාලීන සේවයේ නියැලි සිටින එතුමන් වර්තමානයේ තාරුණ්‍යය දිරිගැන්වීමේ සේවය භාරව කටයුතු කරනු ලබයි. උපදේශන කටයුතුවල නිරත වන අතර ඒ පිළිබඳ වැඩිදුර හදරයි. එතුමන් ශ්‍රී ලංකා මෙතෝදිස්ත සභාවේ ගිහි දේශකයකු ලෙසද කටයුතු කරයි.



**ක්‍රිස්නි එදිරිසිංහ,** BTh, MA (candidate)
**කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ සම්බන්ධීකාරක: ළමා සේවා ක්ෂේත්‍රය.**
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරිණියකි. විසිවසරකට ආසන්නව ඉරුදින පාසල් හා පෙරපාසල් ගුරුවරියක් වශයෙන්ද අනතුරුව "ශ්‍රී ලංකා ළමා ධර්මදූත සහභාගිත්වයේ" (CEF) මොරටු ශාඛාවේ අධ්‍යක්ෂිකාව ලෙසද සේවයකර ඇත. ඇය පිලිපීනයේ ආසියා-ශාන්තිකර නසරීන දේවධර්ම ශාස්ත්‍රාලයේ (APNTS) සාකල්‍ය ළමා සංවර්ධනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියේ අවසාන පර්යේෂණ නිබන්ධනයේ කටයුතුවල නියැලෙන්නීය.



**මධු මිහිරි ප්‍රනාන්දු,** Dip MME, BA, MA
කැලණිය විශ්වවිද්‍යාලයේ උපාධිධාරිණියකි. වසර විසි දෙකක් කොළඹ බිෂොප් විදුහලේ ගුරුවරියක් ලෙස සේවය කළ අතර උපදේශකවරියක් ලෙසද කටයුතු කරයි. ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය නාලිකා හි වැඩසටහන් මෙහෙය වන්නියක් වන අතර කිතුනු ගුරු පුහුණු උපදේශකවරියක් ලෙසද සේවය කරයි. ශ්‍රී ලංකා මෙතෝදිස්ත සභාවේ සම්පූර්ණ ගිහි දේශිකාවකි.



**චමිලා සුභාෂ් රණසිංහ,** HND (Counselling), BTh
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරිණියකි. වසර 8ක කාලයක් සභාපාලිකාවක් ලෙස සේවයේ නිරතව සිටි අතර, පසුව ජීවිතාලෝක ආයතනයේ සිංහල සේවා කළමණාකාරිනිය වශයෙන්ද කටයුතු කරන ලදි. රූපවාහිනි සහ ගුවන්විදුලි කිතුනු වැඩසටහන් නිෂ්පාදිකාවක් සහ නිවේදිකාවක් වන අතර කිතුනු ලිපි හා පොත්පත් ලේඛිකාවක්ද වෙයි. ශ්‍රී ලංකා පදනම් ආයතනයේ උපදේශනය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව ද (NDC) උසස් ජාතික ඩිප්ලෝමාව ද (HND) ලබා ඇත. මෙතෝදිස්ත සභාවේ ගිහි දේශිකාවකි.


# කථිකාචාර්යවරුන්ගේ විස්තර




**රවින් කල්දේරා,** DipAgri, BTh, BA , MA
**කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ පීඨාධිපතිය.** කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ හා විවෘත විශ්ව විද්‍යාලයේ උපාධිධාරියෙකි. ඩලස් දේවධර්ම ශාස්ත්‍රාලයෙන් බයිබල් අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇති හෙතෙම අවුරුදු ගණනාවක පුරෝගාමී සභාරෝපණ සේවයේ අත්දැකීම් ඇත්තෙකි. පුරාතන මැදපෙරදිග හා බයිබලයේ භූගෝලය පිළිබඳ අවබෝධය නිසා ලංකාවේ ප්‍රකාශනයන්හි සිතියම් නිර්මාණය සඳහා සම්පත් දයකයකු ලෙස කටයුතු කොට ඇත. ජීවමාන ක්‍රිස්තු සභාවේ දේවගැතිවරයෙකි.



**සරත් ද සිල්වා,** BTh, MDiv
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ දේවවේදී උපාධියද, නායකත්වය පිළිබඳ ජාත්‍යන්තර උපාධි විද්‍යාලයේ (IGSL–Philippines) ශාස්ත්‍රපති උපාධියද ලබා ඇත. වසර 30කට අධික කාලයක් පුරා විවිධ සේවා ක්ෂේත්‍රවල පුළුල් අත්දැකීම් ඇති, වර්තමානයේ ඌව, නැගෙනහිර හා බස්නාහිර යන පළාත්හි බොහෝ පුරෝගාමි සේවකයින්ගේ මිත්‍රෝපදේශයෙකු (Mentor) ලෙස කටයුතු කරයි. තවද පීඩා විඳින සභාවන් වෙනුවෙන් සේවය කරන නිව් හාර්වෙස්ට් ෆවුන්ඩේෂන් ආයතනයේ ජාතික අධ්‍යක්ෂක වශයෙන් ද කටයුතු කරයි. ජීවමාන ක්‍රිස්තු සභාවේ දේවගැතිවරයෙකි.



**ජී පී වී සෝමරත්න,** BA, MA (Missiology), MA (Theology), PgDip (Demography), PhD
**කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ හිටපු පර්යේෂණ අංශ භාර මහාචාර්යතුමාය.** විපුල ඵලැති ගවේෂකයෙකු හා අධ්‍යාපනික පොත් සහ ලිපිවල කර්තෘවරයෙකි. මෙතුමා කොළඹ විශ්වවිද්‍යාලයේ නූතන ඉතිහාසය පිළිබඳ මහාචාර්ය ධූරය හෙබවූ අතර යෙරුසලමේ හෙබ්‍රෙව් විශ්වවිද්‍යාලයේ ටෲමන් ආයතනයේ ද, ලී විශ්වවිද්‍යාලයේ සහ ෆුලර් දේවධර්ම ශාස්ත්‍රාලයේ බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස ද සේවය කර ඇත. කාණ්ඩ හතකින් සමන්විත ශුද්ධ බයිබලයේ විශ්වකෝෂයේ කර්තෘවරයාය.



**දුලිප් ප්‍රනාන්දු,** BSc (Eng), BD, ThM
විශ්‍රාමික මෙතෝදිස්ත දේවගැතිවරයෙකි. මෙතුමා පේරාදෙනිය විශ්ව විද්‍යාලයේද ලන්ඩන් දේවධර්ම විද්‍යාලයේද (එක්සත් රාජධානිය) ෆුලර් දේවධර්ම ශාස්ත්‍රාලයේද (ඇමරිකාව) උපාධිධාරියෙකි. ඉංජිනේරු පසුබිමක් සහිත මෙතුමා කටුබැද්ද උසස් තාක්ෂණික විද්‍යාලයේද පසුව මොරටුව විශ්ව විද්‍යාලයේද දේශකයකු ලෙස කටයුතු කර ඇත. එතුමා ශ්‍රී ලංකා මෙතෝදිස්ත සභාවේ සභාපතිවරයෙකු ලෙසද කටයුතු කර ඇත.

# කථිකාචාර්යවරුන්ගේ විස්තර



**මිශෙල් පීරිස්,** BTh, MA
ලංකා දේව සභාවේ (එසෙම්බ්ලීස් ඔෆ් ගෝඩ් ඔෆ් සිලෝන්) බලපත්‍රලාභී දේවගැතිවරියක වන ඇය ජාතික මට්ටමින් තරුණ සේවය සඳහා විෂයමාලා සකස් කිරීමට සම්බන්ධ වී ඇත. ආසියා පැසිෆික් දේවධර්ම ශාස්ත්‍රාලයේ (APTS) සහ දකුණු ආසියා බයිබල් විද්‍යාලයේ (SABC) උපාධිධාරිනියකි. ඇය ශ්‍රී ලංකාවේ බයිබල් විද්‍යාලවල ප්‍රායෝගික දේවධර්මය සහ ඉතිහාසය පිළිබඳ පාඨමාලා ඉගැන්වීමේ බාහිර කථිකාචාර්යවරියක් ලෙස සේවය කර ඇත.



**ශාලිනි රොඩ්‍රිගෝ,** BA (Psychology), MA (candidate)
නිව්යෝර්ක්හි හවුටන් විද්‍යාලයේ උපාධිධාරිනියෙකි. කොන් කරන ලද හා පීඩාවට පත් කාන්තාවන් හා ළමුන් පිළිබඳ කටයුතු කරන Community Hope ආයතනයේ සභාපතිනිය/ ප්‍රධාන විධායක නිලධාරිනිය ලෙස කටයුතු කරයි. ශ්‍රී ලංකා ඉවැන්ජලිකල් වෙස්ලියන් සභාවේ නායිකාවකි.




**පත්මසීලි ගුණතිලක,** BA, MA
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යාව හා මානව විද්‍යාව පිළිබඳ විශේෂ උපාධි හැදෑරූ උපාධිධාරිනියක් වන අතර, පිලිපීනයේ ජාත්‍යන්තර උපාධි විද්‍යාලයේ ද උපාධිධාරිනියකි. ශ්‍රී ලංකා කැම්පස් ක්‍රෑසේඩ් ආයතනයේ වසර 14ක කාලයක් ගෝලයන් ගොඩ නැගීම සහ නායකයන් පුහුණු කිරීමේ සේවය තුළ ද නිරතවිය. පූජක භාර්යාවක් ලෙස ද, සභාවේ දේශනා කිරීම ඇතුළු විවිධ සේවයන් වල ද නිරතවූවෙකි. ශ්‍රී ලංකා බයිබල් සංගමය සමග වසර 8ක පමණ කාලයක්; කම්පනයට පත් දරුවන්, නවයොවුන් දරුවන් හා වැඩිහිටියන් සුවපත් කිරීමේ ප්‍රධාන පහසුකම් සලස්සන්නෙක් ලෙස ද සේවය කර අත්දැකීම් ලැබූවෙකි. (Master Facilitator (HWOT) – 'Healing the Wounds of Trauma' for Children, Teenagers and Adults)



**ප්‍රබෝ මිහිඳුකුලසූරිය,** PgDipM (CIM), MA, PhD
වැන්කුවර්හි රීජන්ට් විද්‍යාලයේ සහ කොළඹ විශ්වවිද්‍යාලයේ උපාධිධාරියෙකු වේ. කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ හිටපු උප විදුහල්පතිය. එතුමාගේ ආචාර්ය උපාධි නිබන්ධනය වූයේ බ්‍රිතාන්‍ය ක්‍රිස්තියානි මානුෂීයත්වය සහ ශ්‍රී ලාංකේය නිදහස් ව්‍යාපාරය සම්බන්ධවය. ගුරුවරයෙකු ලෙස එතුමා උත්සාහ දරන්නේ ඉතිහාසය සහ දේවධර්මය යන ක්ෂේත්‍ර තුළින් වෙළඳපොළ, ශාස්ත්‍රීය ලෝකය සහ ප්‍රජා ජීවිතය තුළ දේව රාජ්‍යය වෙත යොමුවූ ගෝලත්වය පෝෂණය කිරීම ය.

# කථිකාචාර්යවරුන්ගේ විස්තර



**නිරෝෂන් පෙරේරා,** BTh, MTD

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකි. ජනතා දේව සභාව, එසෙම්බ්ලි ඔෆ් ගෝඩ්හි දේවගැතිවරයකු වන අතර Awake A Nationහි ජාතික අධ්‍යක්ෂකවරයා ද ලොවට පියෙක් අවශයයි ප්‍රගමනයේ ශ්‍රී ලංකාවේ කැඳවුම්කරු ද වේ. Global Impact සහ Habitat for Humanityහි පාලක මණ්ඩලයේ සේවය කරයි. ශ්‍රී ලංකාවේ එසෙම්බ්ලීස් ඔෆ් ගෝඩ්හි උප සභාපතිවරයා ලෙස සේවය කරයි. එතුමාගේ දිගුකාලීන සේවා ජීවිතයේ ජනතා දේව සභාවේ තරුණ සේවය භාර සභාපාලකවරයා ලෙස ද සභා රෝපණය සහ සහන සේවාවල මෙන්ම උතුරු උගන්ඩාවේ ගුලුහි මිශනාරි සභා රෝපණය කිරීමේ සේවයේ නියැළී ඇත.

# CTS පාඨමාලා විස්තර

ශිෂ්‍යයන් කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ පාඨමාලා හැදෑරීම සඳහා සාදරයෙන් පිළිගන්නා අතර අධ්‍යයන පාඨමාලා හැදෑරීම සඳහා අප ඔබ දිරිමත් කරන්නේ කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය වෙතින් ඔබට ලබාගත හැකි උපරිමය අත්කරගනු සඳහාය.

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය විසින් පෙළ හතරක අධ්‍යාපනයක් පිරිනමයි. ඒ සියල්ල ම ආසියානු දේවවේදී සංගමය (ATA) විසින් පිළිගනු ලැබූ ඒවා වේ. ඔබට වඩාත් ගැළපෙන්නේ කුමන පාඨමාලාවදැයි කියවා අනාවරණය කරගන්න.

**ක්‍රිස්තියානි අධ්‍යාපන සහතිකය (CCS)**
21 වැනි සියවසේ ජීවිතය, රැකියාව හා සේවය වෙනුවෙන් (ගිහි) කිතුනුවන් සවිගැන්වීම පිණිස මෙය සැලසුම් කර ඇත.
ඉගැන්වීම් මාධ්‍ය: ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ
*අවශ්‍ය සම්මාන ප්‍රමාණය 36කි*

**ක්‍රිස්තියානි අධ්‍යාපන සහතිකය: ළමා සේවා ක්ෂේත්‍රය (CCS-CM)**
සභාව සහ සමාජය සඳහා ඵලදායී ළමා සේවා සේවකයින් සන්නද්ධ කිරීමට නිර්මාණය කර ඇත.
ඉගැන්වීම් මාධ්‍ය: සිංහල සහ දෙමළ
*අවශ්‍ය සම්මාන ප්‍රමාණය 36කි*
*අන්තර්ජාලය හරහා ඉගැන්වේ*

**දේවධර්ම ඩිප්ලෝමා (DipTh)**
කිතුනු සේවකයන් සඳහා ගැඹුරු බයිබලීය අන්තර් දෘෂ්ටියක් හා සේවය සඳහා නිපුණත්වයක් ලබාදීම සඳහා මෙය සැලසුම් කර ඇත.
ඉගැන්වීම් මාධ්‍ය: ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ
*අවශ්‍ය සම්මාන ප්‍රමාණය 72කි*

**දේවධර්ම උපාධිය (BTh)**
සභා නායකත්වය (දේවගැති සේවය, ඉගැන්වීම සහ එවැනි සේවා) සඳහා කිතුනුවන් පුහුණු කිරීම සඳහා මෙය සැලසුම් කර ඇත.
ඉගැන්වීම් මාධ්‍ය: ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ
*අවශ්‍ය සම්මාන ප්‍රමාණය 108කි*

***වැඩි විස්තර/ සහය සඳහා විමසන්න:***


අධ්‍යයන කාර්යාලය
011 2890809; registrar@cts.lk; www.cts.lk

# ක්‍රිස්තියානි අධ්‍යාපන සහතිකය
# ළමා සේවා ක්ෂේත්‍රය

**<u>පාඨමාලාව:</u>**

- පාඨමාලාවක් සාමාන්‍යයෙන් සතියකට දෙවරක් පැය 3ක කාලයක් පැවැත්වේ.
- සෑම පාඨමාලාවක් සඳහා සම්මාන පැය දෙකකි.
- වසර 2කින් ශිෂ්‍යයා හට මෙම විෂයමාලාව නිම කළ හැකිවන අයුරින් සැලසුම් කර ඇත.

| | විෂයන් | සම්මාන |
|---|---|---|
| අනිවාර්ය | | |
| බයිබලය සහ දේවධර්ම විෂයන් | 04 | 08 |
| ළමා සේවා විෂයන් | 04 | 08 |
| වෛකල්පික විෂයන් | 10 | 20 |
| සම්මන්ත්‍රණ | 04 | 00 |
| එකතුව | 22 | 36 |

සැ.යු.: සහතික පත්‍රය ලබාගැනීමට ඉහත සියලු විෂයන් සම්පූර්ණ කළ යුතු වේ.

**<u>පාඨමාලා දේශන පැවැත්වීම:</u>**

- **අන්තර්ජාලය හරහා:** පාඨමාලාව Zoom තාක්ෂණය හරහා ඉගැන්වෙන අතර අදළ සටහන් Moodle පහසුකම තුළින් ලබා ගත හැකිය. ඔබට වේගවත් අන්තර්ජාල සම්බන්ධතාවක් හා ඩිජිටල් උපාංගයක් අවශ්‍ය වනු ඇත.

**<u>සන්නිවේදන තොරතුරු:</u>**

සම්බන්ධීකාරක: ළමා සේවා ක්ෂේත්‍රය
ක්‍රිස්නි එදිරිසිංහ මිය cm@cts.lk

# ක්‍රිස්තියානි අධ්‍යාපන සහතිකය
# ළමා සේවා ක්ෂේත්‍රය

**<u>අනිවාර්ය: බයිබලය සහ දේවධර්ම විෂයන්</u>**

දරු දැරියන් පිළිබඳව බයිබලීය දැක්ම
දේවධර්මයට හැඳින්වීම
නව ගිවිසුමට හැඳින්වීමක්
ක්‍රිස්තියානි ලෝකදෘෂ්ටියක් වර්ධනය කිරීම

**<u>අනිවාර්ය: ළමා සේවා විෂයන්</u>**

සාකල්‍ය ළමා සංවර්ධනය
දරු දැරියන්ට බයිබලය ඉගැන්වීම
ළමා සේවයේ ආචාරධර්ම
ළමයා, කිතුනු සභාව හා ධර්මදූත සේවය

**<u>වෛකල්පික විෂයන්</u>**

අපයෝජනයට ලක් වූ දරුවන් වෙත සේවය
දරු දැරියන් සඳහා ක්‍රිස්තියානි අධ්‍යාපන වැඩසටහන් නිර්මාණය කිරීම
අවදානම් සහිත දරුවන් කෙරෙහි සභාවේ භූමිකාව
ඔබ තුළ ඇති නායකත්වය වර්ධනය කිරීම
රැකවරණය සලසන්නාගේ ආත්මික හැඩගැස්ම සහ ආතතිය කළමනාකරණය
සංස්කෘතිය අවබෝධ කරගැනීම
කිතුනු දෙමාපියභාවය
යෞවන යෞවනියන් සඳහා සේවය
ළමා උපදේශනය
දරු දැරියන් සඳහා ශ්‍රාවකත්වය

*නොවැළැක්විය හැකි හේතු මත ප්‍රකාශිත විෂයන්වල වෙනස්කම් සිදුවිය හැකිය.*







CTS පුස්තකාලය

**පොත් 40,000කට**
**වඩා එකතුවක් සහිත පුස්තකාලයක්**

**CTS පුස්තකාලය**
**දේව වචනය ඉගෙන ගැනීමට**
**මහත් ආශාවක් ඇති**
**සෑම කිතුනුවෙකුටම**
**ඉතා වටිනා සම්පතකි!**

**CTS පුස්තකාලය හා අදම සම්බන්ධ වන්න!**

වැඩි විස්තර සඳහා
2890809 library@cts.lk

**CTS පුස්තකාලය සියලු සභාවන්ට විවෘතය**




189 දුටුගැමුණු වීදිය, කොහුවල | 011 5524257 | registrar@cts.lk | www.cts.lk